**මධ්‍යම සංස්කෘතික අරමුදල - 2018**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

2003 ජුනි 02 වැනි දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය ප්‍රකාරව ඉදිරිපත් කළයුතු 2018 සහ 2019 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2020 අගෝස්තු 24 දින 3.i කාණ්ඩ යටතේ 2018 සහ 2019 වර්ෂවල මෙහෙයුම් පිළිබඳව වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද අතර ඊට වැඩිමනත් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ,මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි, 29(ඇ) ඡේදය ප්‍රකාරව අස්තිත්වයේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය සම්බන්ධයෙන්, යම් විශේෂිත ගණුදෙනුවක්, අනෙකුත් සිදුවීම් සහ තත්ත්වයන්ගේ බලපෑම තේරුම්ගැනීමට, ශ්‍රී ලංකා | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි, 29 (ඇ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති විශේෂ අරමුදල් සම්බන්ධයෙන් හෙළිදරව් කළ යුතු අතිරේක තොරතුරු ඉදිරි මූල්‍ය | ප්‍රමිතියේ නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රමාණවත් නොවන විට භාවිතා කරන්නන්ට ඒවා තේරුම්ගත හැකිවන පරිදි අතිරේක හෙළිදරව් කිරීම් සිදුකළ යුතු වුවද ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණු රු.9,025,802 ක් වූ විශේෂ අරමුදල් ව්‍යාපෘති 11 ක්, රු.4,757,900 ක් වූ විදේශ අරමුදල් ව්‍යාපෘති 05 ක් සහ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු.676,432 ක් වූ විදේශ අරමුදල් ව්‍යාපෘති 01 ක් සම්බන්ධයෙන් එම අරමුදල්වල ස්වභාවය, අරමුදල ලැබුණු වර්ෂය, අරමුදල ලැබුණේ කුමන කරුණක් සඳහාද යනාදී තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රකාශන පිළියෙළ කිරීමේදී හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. 2021 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී මෙම තොරතුරු සටහන් අංක 3 යටතේ හෙළිදරවු කිරීමට දැනටමත් කටයුතු කර ඇති බවද වැඩිදුරටත් දන්වා සිටිමි. | |
| (ආ) | අරමුදල විසින් භාවිතා කරනු ලබන වටිනාකම තහවුරු නොවූ ගිණුම්කරණ මෘදුකාංග (Sage 50) පද්ධතිය හා 2018 වර්ෂයේ මිලදී ගත් රු.182,500ක් වූ වැටුප් මෘදුකාංගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අස්පෘෂ්‍ය වත්කම් යටතේ දක්වා නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම ගිණුම්කරණ මෘදුකාංගයහා වැටුප් සකස් කරනු ලබන මෘදුකාංගය මූල්‍ය ප්‍රකාශනවල අස්පෘෂ්‍ය වත්කම් යටතේ දැක්වීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමු. | මෘදුකාංගවල වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල අස්පෘෂ්‍ය වත්කම් යටතේ දැක්වීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| .විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අඩමාණ ණය වෙන්කිරීම සම්බන්ධයෙන් අරමුදල විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර වර්ෂ 05 කට වැඩි කාලයක සිට අය නොවන රු.3,432,121 ක ණයගැති ශේෂයක් පැවතියද ඒ පිළිබඳ සමාලෝචනය කිරීමකින් තොරව සෑම වර්ෂයකදීම රු.1,964,833 ක නොවෙනස් අඩමාණ ණය ශේෂයක් අඛණ්ඩව පවත්වාගෙන යමින් පැවතුණි. | අඩමාන ණය වෙන් කිරිම සම්බන්ධයෙන් අරමුදල විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 2.3 යටතේ දක්වා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.<br>2012 වසරේ ණයගැතියන් සමාලෝචනය කර අඩමාණ ණය ලෙස වෙන්කර ඇති මුදලින් කොටසක් මේ දක්වා පවතින බැවින් හා ඊට පසු වර්ෂවලදී ණයගැතියන් සමාලෝචනය කිරීමේදි එලෙස අඩමාණ ණය ලෙස වෙන් කිරීමට ශේෂයන් හඳුනාගෙන නොමැති බැවින් එම වෙන්කරන ලද මුදල මේ දක්වා පවතින බවත් එය සමාලෝචිත වර්ෂයේදී සිදුකරන ලද වෙන්කිරීමක් නොවන බවත් කාරුණිකව දන්වා සිටිමි. | ණයගැතියන් සමාලෝචනය කර එලෙස වෙන් කිරීම් සිදු කිරීමට ඇති ශේෂයන් හඳුනාගෙන අඩමාණ ණය වෙන්කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.4 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව 2018 මැයි 31 දිනට මුදල් පොතේ ශේෂය රු.37,892,760ක් වුවද අරමුදලේ ගිණුම් කටයුතු සඳහා යොදා ගනු ලබන Sage 50 ගිණුම්කරණ මෘදුකාංගයට අනුව එදිනට මුදල් පොතේ ශේෂය රු.33,542,285ක් වූයෙන් එම ශේෂයෙන්ම රු.4,350,475ක වෙනසක් නිරීක්ෂණය විය. | අත් අකුරින් පවත්වාගෙන යනු ලබන මුදල් පොතෙහි ගනුදෙනු චෙක්පත් නිකුත් කරනු ගබන අවස්ථාවේදීම සටහන් කරනු ලබයි. චෙක්පත් පරිගණකයෙන් මුද්‍රණය කරනු ලබන නිලධාරීන් සේවයෙන් ඉල්ලා අස්වීම, හදිසියේ සේවය හැරදායාම වැනි හේතූන් නිසා සමහර චෙක්පත් පරිගණකයෙන් මුද්‍රණය නොකර අතින් ලියා නිකුත් කර පසුව පරිගණකගත කිරීමට සිදුවේ. මේ හේතුව නිසාත් සහ ගෙවීම් චෙක්පත් පරිගණකගත කිරීමේදී නිකුත් කරන ලද දිනය නිවැරදිව සටහන් නොකිරීම වැනි හේතු නිසා බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීමට උපයෝගී කර ගන්නා මැනුවල් මුදල් පොතෙහි නිවැරදි මුදල් ශේෂය සමග Sage 50 ගිණුම්කරණ මෘදුකාංගය තුල ඇති මුදල් පොතෙහි මුදල් ශේෂය සමහර මාස වලදී නොගැලපේ. වර්ෂය අවසානයේදී මෙම මුදල් පොත් දෙකෙහිම ශේෂයන් සමාන වුවද මෙම මුදල් පොත් දෙකෙහිම මාසික මෙන්ම දෛනික මුදල් ශේෂයන් සමානව පවත්වාගෙන යාමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. | පරිගණක ගිණුම්කරණ මෘදුකාංගය තුලින් ලබා ගන්නා ලද දත්තයන්ගේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට අභ්‍යන්තර පාලන උපක්‍රම හඳුන්වා දී ක්‍රියාත්මක කළ යුතු අතර අදාළ වෙනස්කම් ඒ ඒ අවස්ථාවේදී සැසඳීම් කර නිසි අනුමැතීන් මත ජර්නල් සටහන් යොදා වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂය තුළ ආයෝජනය කරන ලද වටිනාකම රු.730,000,000 ක් වූ ස්ථාවර තැන්පතු 04 ට අදාළව 2018 දෙසම්බර් 31 දිනට ලැබිය යුතු පොළිය රු.51,426,027 ක් වුවද එය රු.50,509,589 ක් ලෙස ගිණුම්ගතකර තිබීම හේතුවෙන් ලැබිය යුතු පොළිය රු.916,438 කින් අඩුවෙන් දැක්වුණි. | 2018 වර්ෂයේදී තැන්පත් කරන ලද රු. 730,000,000/= මුදලට අදාල පොළිය ගනනය කිරීම නැවත පරීක්ෂාකර පිළිතුරු ලබාදීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන විගණනය වෙත බාරදී ඇති බැවින් එම ලිපිලේඛන ගෙන්වා ගැනීමෙන් පසු කඩිනමින් පිළිතුරක් ලබාදීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. | ලැබිය යුතු පොළිය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බැංකු ගිණුම් 02 ක ඇතුළත් මාස 06 ක සිට පැවත එන රු. 940,055 ක සෘජු බැරකිරීම් හඳුනා ගෙන වර්ෂයේ ආදායමට ගැළපුම් කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණනය වෙත අදාල ලේඛන හා සාරාංශ ඉදිරිපත් කර ඇති බැවින් මෙම විගණන විමසුම සඳහා පිළිතුරු සපයා දිය නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි. | සෘජු බැරකිරීම් හඳුනා ගෙන වර්ෂයේ ආදායමට ගැළපුම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අංක 73254947 දරන ස්ථාවර තැන්පතුව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබූ රු.1,702,055 ක පොළී මුදල, වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ලැබිය යුතු පොළී ගිණුමට ගිණුම්ගත කර තිබුණි. | ආදායම් ගිණුම්ගත කරනු ලබන්නේ උපචිත පදනම යටතේය. එනම් ආදායම ලැබෙන දිනය නොසලකා එම ආදායම අදාල වන කාළ පරිච්ඡේදය සඳහා ගිණුම්ගත කරනු ලබයි. ඒ අනුව පොළී මුදල් ලැබෙන තෙක් බලා නොසිට ගිණුම් වර්ෂයට අදාල පොළී කොටස ගණනය කර පොළී ආදායම් ගිණුම බැරකර ලැබිය යුතු පොළී මුදල් ගිණුම හර කරයි. පොළී මුදල් ලැබෙන දිනයේදී ලැබිය යුතු පොළී මුදල් ගිණුම බැර කරයි.<br>ඒ අනුව 73254947 දරන ස්ථාවර තැන්පතුවෙන් ජනිත වූ පොළී ආදායම නිවැරදිව ගිණුම්ගතකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි | වර්ෂයට අදාල පොළී, වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ 4(ඊ) වගන්තිය ප්‍රකාරව අරමුදලේ මුදල් ආයෝජනය කිරීමට සහ එම ආයෝජන ආපසු ලබාගැනීමට පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුව ද 2018 වර්ෂයේ අංක 208.4.1 දරන පාලක මණ්ඩල පත්‍රිකාවේ ආයෝජන විස්තරය තුළ ඇතුලත් නොවූ එකතුව රු.450,000,000 ක ආයෝජන කිරීම් 02 ක් සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පාලක මණ්ඩල සාමාජිකයන්ගේ කාර්ය බහුලත්වය හේතුවෙන් ප්‍රමාණවත් පරිදි රැස්වීම් සංවිධානය කර ගැනීමේ දී අපහසුතාවයක් ඇත. එබැවින් ආයෝජන ආපසු ලබා ගැනීමේදී පූර්ව අනුමැතිය ලබා ගැනීම ප්‍රායෝගිව සිදු කිරීම අපහසු කාර්යයකි.<br>ආයෝජන ආපසු ලබා ගැනීමෙන්/තැන්පත් කිරීමෙන් පසු ඒ සඳහා පාලක මණ්ඩල ආවරණ අනුමැතියවත් ලබා ගැනීම සඳහා ප්‍රථම වරට කටයුතු කොට ඇත්තේ 2018 වර්ෂයේදී සිදුකොට තිබූ ආයෝජන ක්‍රියාකාරකම් සඳහාය.<br>විගණන විමසුම මගින් පෙන්වා | පනතේ විධිවිධාන ප්‍රකාරව ආයෝජන නැවත ලබා ගැනීම පාලක මණ්ඩලයේ පූර්ව අනුමැතිය මත සිදු කිරීමට කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| | | දී ඇති පරිදි ඉදිරි ආයෝජන සිදුකිරීමේදී මෙන්ම ආපසු ලබාගැනීමේදී හැකිතාක් පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි. | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 05 කට වැඩි කාලයක සිට පෞද්ගලික හා රජයේ ආයතනවලින් අයවිය යුතු, මූල්‍ය ප්‍රකාශනවල දිගුකාලීන ලැබිය යුතු ශේෂ ලෙස ඇතුළත් වූ රු.3,432,121 ක් අයකර ගැනීමට අරමුදල ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | වර්ෂ 05 කට වැඩි කාළයක සිට පැවැත එන ණය ශේෂයන් අයකර ගැනීමට ඉදිරි පියවර ගන්නා බවත් ඒවා අයකර ගත නොහැකි නම් මූල්‍ය ප්‍රකාශන වලින් කපා හැරීමට කටයුතු කරනු ලබන බවත් කාරුණිකව සඳහන් කරමි. | වර්ෂ 05 කට වැඩි කාළයක සිට පැවැත එන ණය ශේෂයන්අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු රු.8,141,284 ක්වූ තැන්පතු ශේෂයන්ට අදාළ කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | උපචිත වියදම්වල ඇතුලත් රු. 8,141,309.12 ක් වටිනා ආපසු ගෙවනු ලබන තැන්පතු සඳහා වෙනම උපලේඛනයක් ලබාදී ඇත. ආපසු ගෙවනු ලබන තැන්පතු ගිණුමේ ගණුදෙනු විශාල ප්‍රමාණයක් පැවතීම හේතුවෙන් මෙලෙස වෙනම ලබාදී ඇත. | ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂයන්ට අදාළ කාල විශ්ලේෂණ සකස් කර විගණනයට ඉදිරිපත් කිරිමට කටයුතු කල යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කරන ලද ණයගැති කාල විශ්ලේෂණය අනුව වර්ෂ 05 ඉක්ම වූ නිවාස ණය, උත්සව අත්තිකාරම්, වාහන ණය හා විශේෂ අත්තිකාරම් ශේෂ පිළිවෙලින් රු.20,736,853 ක් රු.1,202,010 ක් රු.114,885 ක් හා රු.86,441 ක් වූ අතර | මෙම විගණන විමසුමෙහි පෙන්වා දී ඇති පරිදි 2000 වර්ෂයන්ට පෙර මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවය කරන ලද අනියම් කම්කරු හා නිළධාරීහට ගෙවන ලද විශේෂ ණය , උත්සව අත්තිකාරම් මුදල් වලින් හඳුනාගත් කොටස් අයකර ගැනීමෙන් පසු තවදුරටත් | ණය අයකර ගැනීම පිළිබඳ වූ ක්‍රියාවලිය ඉහළ කළමනාකරණය විසින් විධිමත් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ යුතු අතර, මෙම ණය, සම්බන්ධ ඇප වීම් ඇත්නම් එම ඇපකරුවන් ගෙන් අයකර ගැනීමට හෝ හඳුනාගත් අයකර ගත හැකි |

| | | |
|---|---|---|
| එම ණය අයකර ගැනීමට අරමුදල ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | හදුනාගත නොහැකිව ගිණුම පොත්පත් වල දිගින් දිගටම පැවත එන පැරණි හිඟහිටි ණය ශේෂයයි. 1998 ට පෙර වර්ෂයන්හි පොත් තැබීම හා අවසන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම බාහිර ආයතනයක් ලවා කරවාගෙන තිබූ බැවින් මෙම තොරතුරු ආයතනය සතුව නොතිබීම නිසා විගණන හා කළමනාකරණ කමිටුව ලබාදෙන ලද උපදෙස් පරිදි පාලක මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් පසු 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් ණය මුදල් වලින් කොටසක් පොත් වලින් ලියා හැරීමට කටයුතු කරන ලදි. | ණය, අයකර ගැනීමටත් කඩිනම් පියවර ගත යුතුය. |

**\1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 2003 ජුනි 02 වැනි දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය | අදාල වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල අයවැය ලේඛනය විගණකාධිපති, රේඛීය අමාත්‍යාංශ ලේකම් හා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2018 වර්ෂය සඳහා වූ අරමුදලේ අයවැය ලේඛනය, පාලක මණ්ඩලය විසින් වර්ෂය ආරම්භ වී මාස 02 කට පසු 2018 පෙබරවාරි 28 දින අනුමත කර තිබුණ ද අනුමත අයවැය විගණකාධිපති වෙත නියමිත පරිදි ඉදිරිපත් කර නොතිබුණි. | අරමුදලේ පාලක මණ්ඩලයේ සභාපති වන ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු අනෙකුත් සාමාජිකභවතුන්ගේ කාර්ය බහුලත්වය නිසා අවශ්‍යතාවය පරිදි රැස්වීම් සංවිධානය කර ගැනීමේ අපහසුතාවය සහ වෙනත් නොවැළැක්විය හැකි හේතූන් මත මෙලෙස නිසි කලට අයවැය අනුමත කරවා ගැනීමට නොහැකිවී ඇත. කෙසේ වුවද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 අනුව කටයුතු කිරීමට හැකි සෑම උත්සාහයක්ම ඉදිරියට ගන්නා බව කාරුණිකව සඳහන් කරමි | චක්‍රලේඛය ප්‍රකාරව අයවැය ලේඛනය නියමිත කාලය තුල පිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු1,917,023,340 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු1,471,822,640ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 346,200,700 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ ප්‍රවේශ පත්‍ර අදායම රු.424,174,415 කින් හා ආයෝජන පොලී ආදායම රු. 66,170,964 කින් වැඩිවීමත් වෙනත් වියදම් රු.118,032,784 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 ජුලි 17 දිනට කල්පිරීමට නියමිතව තිබූ ගිණුම් අංක 78099850 දරන ස්ථාවර තැන්පතුව 2018 ජුනි 25 දින උපලබ්ධි කරගැනීම හේතුවෙන් අරමුදලට අහිමි වූ පොළී ආදායම රු.3,235,370 ක් විය. | අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන විදේශීය සංචාරකයන්ගේ පැමිණීම වසරේ සෑම මසකම ඒකාකාරී නොවේ. විශේෂයෙන් මැයි හා ජුනි මාසවලදී සේවක වැටුප් ගෙවීම ඇතුළු දෛනික වියදම් පියවා ගැනීම සඳහාවත් ප්‍රමාණවත් මුදලක් එක්රැස් නොවේ. එවන් අවස්ථාවලදී මුදල් අවශ්‍යතාවය පරිදි මෙලෙස ස්ථාවර තැන්පතු ආපසු ලබාගැනීමට සිදුවන අතර එම තැන්පතුව කල්පිරීමට ප්‍රථම උපලබ්ධිකර ගැනීමට සිදුවිය හැකිය. එවන් අවස්ථාවලදී විගණන නිරීක්ෂණ මඟින් පෙන්වාදෙන අහිමිවන පොළී ආදායම් අවමකර ගැනීමේ පරමාර්ථයෙන් කෙටිකාලීන ස්ථාවර තැන්පතුද අරමුදල මඟින් ඒ වන විට පවත්වාගෙන ගොස් තිබුණි. අංක 78099850 දරන මෙම උපලබ්ධිකර ගෙන තිබූ තැන්පතුවද මාස තුනින් තුනට කල් පිරෙන තැන්පතුවක් වන අතර එම තැන්පතු උපලබ්ධිකර නොගෙන වසරකින් කල් පිරෙන වෙනත් තැන්පතුවක් උපලබ්ධිකර ගත්තේ නම් විගණන නිරීක්ෂණ මඟින් පෙන්වා දෙන අහිමිවන පොළී ආදායම තවත් ඉහළයා හැකිව තිබුණි. ඒ අනුව අරමුදල විසින් අහිමිවන පොළී ආදායම් අවමකර ගැනීමට කටයුතු කර ඇත. | අරමුදලට පාඩු සිදු නොවන පරිදි ස්ථාවර තැන්පතුව උපලබ්ධි කර ගැනීමට පියවර ගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ වටිනාකම රු.327,730,795 ක් වූ ජර්නල් වවුචර් 25 ක් අනුමැතිය ලබා ගැනිමකින් තොරව ගිණුම්ගත කර තිබුණි. | මෙම ජ'නල් වවුචර්පත් අනුමත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව කාරුණිකව සඳහන් කරමි. | ජර්නල් වවුචර් සඳහා පූර්වඅනුමැතිය ලබා ගැනිමෙන් පසු ගනුදෙනු ගිණුම්ගත කිරීමට ක්‍රියා කළයුතු අතර විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ඇති කිරීමට ඉහල කළමනාකරණයේ අවධානය යොමුකළ යුතුවේ. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිස්සමහාරාමය කෞතුකාගාරය ඉදිකිරීමට අදාල ඉඩමේ මිනුම්ගත කිරීමේ කාර්යයන් වෙනුවෙන් 2017 වර්ෂයේදී රු.50,000 ක මිනුම් ගාස්තු ගෙවා තිබූ අතර මෙම ඉඩම අත්පත්කර ගැනීමේ කටයුතු අවසන්කර නොතිබීම හේතුවෙන් විගණන දිනය වූ 2023 මාර්තු 10 දින වනවිටත් කෞතුකාගාරයේ ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | තිස්සමහාරාම කෞතුකාගාරය ඉදිකිරීමට යෝජිත ඉඩමේ අයිතිය නිරවුල්කර ගැනීමට යාමේදී එහි පවතින සංකීර්ණ තත්ත්වය හේතුවෙන් ඒ සඳහා බොහෝ කාළයක් ගත විය. මේ වන විටද එම කටයුතු සිදු කරමින් පවතී. කෙසේ වුවද එම කටයුතු කඩිනම්කරවා ගෙන සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මූලිකව සිදු කලයුතු කාර්යයන් කඩිනමින් ඉටු කර ගෙන ඉදිකිරීම් කටයුතු සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය පියවර ගත යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට පැවත එන කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් ජාතික අනුරූ පාසලේ ඉදිකිරීම් සඳහා රු.4,975,146 ක් ගෙවා තිබූ අතර වාස්තු විද්‍යා උපදෙශක ඉවත්වීම හේතුවෙන් 2017 වර්ෂයේ සිට කොන්ත්‍රාත්කරු විසින් වැඩ අතහැර දමා තිබුණි. | ජාතික අනුරූ පාසලේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පවරනලද කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු අතරමග නැවතී ඇත. මෙම ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීමට ගත හැකි උපරිම ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් තුල විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් අරමුදල විසින් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වර්ෂ 05 ක ප්‍රමාදයකින් පසු 2023 ජනවාරි 20 දින ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව කාලීන පදනමක් මත වාර්තා සැපයීමට අරමුදල අපොහොසත් වී තිබීම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රයෝජනවත්භාවය ද හානිකරණයට භාජනය වී තිබුණි. | අරමුදලේ පාලක මණ්ඩලය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් හා වෙනත් අමාත්‍යවරුන්ගෙන්ද සමන්විත වන බැවින් මෙම සාමාජිකයන්ගේ කාර්ය බහුලත්වය හේතුවෙන් අවශ්‍යතාවය පරිදි රුස්වීම් සංවිධානය කර ගැනීමට නොහැකිවීම, මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පවරන ලද නිලධාරීන් බොහෝ ප්‍රමාණයක් සේවයෙන් ඉල්ලා අස්වීම (ගිණුම් නිළධාරීන් 4 දෙනෙකු ඇතුළුව) සහ වෙනත් නොවැළැක්විය හැකි හේතුන් නිසා මෙලෙස නියමිත කාළ සීමාව තුලදී විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |